# සුපිරි තරු සහ අපේ සංගීතය.

දෙවන සුපර් ස්ටා(ර්)ස් තරඟ වටයද, නිමාවට පත්වී ඇත. පෙර වාසනා ගුණයෙන් අනූන තරුණ තරුණියෝ පිරිසක් ජනප්‍රියත්වයේ හිණි පෙත්තටම නැග අහස්කුස එකළු කරමින් දිදුලනමින් සිටිති. ප්‍රේක්ෂක ජනයාද අමන්දානන්දනයට පත් වී ඔවුන් දෙස බලා සිටිති.

එබැවින් ලාංකීය සංගීත ක්ෂේත්‍රයේ විකාශය සහ පැවැත්ම සම්බන්ධයෙන් යම් විපරමක් කිරීමට මෙය සුදුසුම මොහොතකැයි මම සිතමි. බොහෝ උගතුන් මහත් සේ අගය කොට සලකන හැත්තෑව දශකයෙන් එය ඇරඹීමට කැමැත්තෙමි.

සරළව පවසතොත් මූලික වශයෙන් හැත්තෑවේදී සිදු වූයේ උත්තර භාරතීය රාගධාරී සංගීතය හදාරා මෙහි පැමිණි තරුණ අමරදේවලා (පණ්ඩිත් අමරදේවයන්, අනෙක් සංගීත විශාරදයින් සහ ඔවුන්ට ගේය පද, තනු නිර්මාණය කළ උගතුන්) හැත්තෑව දශකයේ තරුණයන්ට ගී ගැයීමයි. එකළ තරුණයෝ අද උගතුන්, බුද්ධිමතුන් බවට පත්වී එම ගී ස්මරණය කරති.

හැත්තෑව දශකයේ අමරදේවලාගේ සාර්ථක වීම සංගීතය අද තත්ත්වය දක්වා විකාශය වීමට මූලික වූ බැවින් එම ජනප්‍රියත්වයට හේතු සොයා බැලීම වැදගත්ය. අමරදේවලාගේ තාරුණ්‍යය, තරුණ රසිකයන්ට ඔවුන්ව සමීප කරවීමට ප්‍රධාන හේතුවක් විය. අද ප්‍රධාන වශයෙන් තරුණයන් විසින් මෙහෙයැවෙන සංගිතයේ (ඇතැමෙකු විසින් නව රැල්ල ලෙසින්ද ඇතමෙක් විසින් කොත්තු රොටි සංගීතය ලෙසින් ද හඳුන්වනු ලබන) ජනප්‍රියත්වයට හේතු සිතා බැලීමෙන් එය තේරුම් ගත හැකිය. එමෙන්ම එකළ රටතුළ මුල් බැසගත් වෙනත් සංවිධානාත්මක සංගීතයන් ද නොතිබිණි. මේ සියල්ලටම වැඩියෙන් ලංකා විශ්ව විද්‍යාලයේ පෙරදිග අධ්‍යයනාංශයෙන් උගත්තවුන්ගෙන් (බුද්ධිමත් ලෙස සමාජයේ ප්‍රකට වුවන්ගෙන්) ලද අනුග්‍රහයන් නිසා අමරදේවලා සංගීත ක්ෂේත්‍රයේ අධිපතීත්වයට පත් වූහ.

නමුත් ඊට පසුව මේ සංගීතඥයෝ නිකන් නොසිටියහ. ඉඳහිට වන්නමක් දෙකක් හෝ ජනකවියක් හෝ ගුරුකොට ගනිමින් ගීයක් ගැයුව ද ප්‍රධාන ශයෙන් ඔවුන් තම කාලයත් ශ්‍රමයත් වැය කලේ ලාංකීක සංගීතය උත්තර භාරතීය මහා සම්ප්‍රදායෙන් යැපෙන චූල සම්ප්‍රදායක් බවට පත්කිරීමටය. දැනුවත්ම හෝ නොදැනුවත්ම ඔවුන් කළේ දේශීය (සිංහල) සංගීතයේ යම් යම් අංග භාරතීය සංගීතයට අවශෝෂණය කර එය පෝෂණය කිරීමයි. ඒ හේතුවෙන් දේශීය සංගීතයට උන්හිටි තැන් අහිමි විය.

මේ අතර රට අසූව දශකයට පැමිණියේය. එම කාලය තුල සිදුවූයේ විවෘත ආර්ථිකයේ ඍජු හා වක්‍රබලපෑම් හමුවේ සාමාන්‍ය ජනතාව ආර්ථික සහ සංස්කෘතික වශයෙන් බංකොළොත් භාවයට පත් වීමයි. කෙටියෙන් කිව හොත් හැත්තෑව දශකයේ සංගීතය විසින් ඔවුන්ගේ පැල් කවියද, අසූව දශකයේ විවෘත ආර්ථිකය විසින් ඔවුන්ගේ පැල් කොටයද අහිමි කරන ලදී.

මෙවන් අබුද්දස්ස කාලයක උපන් දරුවන්ට ලබා දුන් අධ්‍යාපන තුලින් ද ආගම කලාව සහ ඉතිහාසය යන විෂයයන් ඉවත් කර තිබීණි. (ආගම වැනි ඇතැම් විෂයයක් එහි තිබුණද ඉගෙනුම් රටාව තුළ ආගම ආගමක් ලෙස නුගැන්විනි. එයද විභාගය ඉලක්ක කල ඊනියා විෂයක් පමණක් විය. එමගින් ලබාදුන් ආගමික අධ්‍යාපනයක් නැත.) මේ සියල්ලටම සමගාමීව ක්‍රියාත්මක වන ජඩ මාධ්‍ය සංස්කෘතියක් ද ක්‍රමයෙන් වර්ධනය විය. මේ ක්‍රියාදාමයේ අවසන් ප්‍රතිඵලය ලෙස අසූවේ දරුවන් (අද තරුණයන්) රට, දැය, සාමය නොහඳුනන සංගීතය කලාව නොදන්නා මන්දබුද්ධිකයන් පිරිසක් බවට පත් වූහ.
මෙම තරුණයන් දැනගෙන සිටියේ සිංහල බසින් ගැයෙන ඕනෑම ගීතයක් (''ගීතයක්'' යනුවෙන් හැඳින්වෙන්නක්) සිංහල සංගීතය බවයි. එපමණක් නොව ඔවුන්ගේ කාලය හැත්තෑව දශකයට වඩා වෙනස් විය. අමරදේවලා පමණක් නොව, කේමදාසලාද භාතිය සංතුෂ්ලා ද කොත්තුරොටි සංගීතඥයින්ද බස් සංගීතඥයින්ද ඔවුන් වෙනුවෙන් ගී ගැයුහ. මෙම ප්‍රවාහයන් අතරින් ඔවුන් තෝරාගත යුත්තේ කුමක් ද? අද ලාංකීය සංගීතය හමුවේ ඇති ප්‍රධාන ප්‍රශ්නය එයයි.

යම් ප්‍රවාහයක් තෝරාගැනීමට නම් මේ තරුණයන්ට ඒ පිළිබඳව බුද්ධියක් පැවතිය යුතුය. නමුත් හැත්තෑවේ සංගීතයද විවෘත ආර්ථිකයද, අධ්‍යාපනයද, විද්‍යුත් මාධ්‍යය ද එක්ව මේ තරුණයන්ගෙන් දේශීය සංගීතයද, රට ද, දැයද, සමයද, සංස්කෘතියද උදුරාගෙන ඇත. එබැවින් මන්ද බුද්ධික වු ඔවුන් දන්නා සංගීතයන් නැත. හොඳ සංගීත ප්‍රවාහය කුමක්දැයි තෝරා ගැනීමට අවැසි පදනම් දැනුම ඔවුන් සතුව නැත.

එපමණක් නොව, අමරදේවලා (මින් අදහස් කරන්නේ පණ්ඩිත් අමරදේවයන් පමණක් නොවේ) අද මහලුය. කේමදාස සංගීතයද තරුණයන්ට කුණුහරුපයක් පමණි. සුපිරි තරු නැගී එනවිට මොවුහු ඉරබටු තරු මෙන් බැස යමින් සිටිති. මහලු සංගීතයට සවන්දීමට තරුණයන් නොපෙළඹෙති. එමෙන් ම පෙරදිග අධ්‍යයනාංශයේ බුද්ධිමය ආධිපත්‍යයද රටතුළ මහලු වෙමින් (හීන වෙමින්) පවතී.

මින් පෙනී යන්නේ හැත්තෑවේ රැල්ලට සහයෝගය දෙන සාධක අද ඉතිරිව නොමැති බවයි. තරුණ ජවය නව රැල්ලට ආවඩයි. කොල්ලන් ගයන, කෙල්ලන් රඟන කොත්තුරොටී සංගීතය (එෆ්.එම්.සංගීතය) කළ එළි බසිමින් සිටියි. එමෙන්ම පෙරදිග අධ්‍යයනාංශයේ බුද්ධිමය ආධිපත්‍යයට ප්‍රතිපක්ෂව ජඩ මාධ්‍යයන්ගේ ආධිපත්‍යය පැතිරෙමින් තිබේ.

මෙලෙසින් රටේ සංගීතය නන්නත්තාර වී ඇති මොහොතක සුපිරි තාරකාවෝ පායා නැගී එති. රටේ ජනතාව, ප්‍රධාන වශයෙන් අසූවේ දරුවෝ එම තරු වලට ආලෝකය සපයමින් සිටිති. විද්වත් විනිශ්චයක් නොමැති වුව ද, ප්‍රබුද්ධ සංගීතඥයන්ගෙ ආශිර්වාදය නොමැති වුවද මේ සුපිරි තරු පිළිගැනීමට තරුණ පෙළ මග දෙපස රැස් කති. ඉන් කියැවෙන්නේ සංගීතයේ අනාගතය තීරණය කිරීමට ප්‍රබුද්ධයන්ගේ (අමරදේවලාගේ හෝ කේමදාසලාගේ) දායකත්වය අනවශ්‍ය බව අද සමාජය තීරණය කර ඇති බවයි. අද හෙටම හෝ පමා වී හෝ මේ තරුවල සුපිරි බව පිළිගැනීම හැර, ප්‍රබුද්ධයන්ට කළ හැකි අන් යමක් නොමැතිය.

නමුත් තවත් කිය යුත්තක් ඉතිරිව ඇත. අද තත්වය මෙබඳු නම් හෙට තත්ත්වය කෙබඳු වේදැයි අපි සිතා බැලිය යුතු වෙමු. අද දිදුලන සුපිරි තරු කාගේ නිර්මාණයක් දැයි අපි සිතා බැලිය යුතු වෙමු. ඔවුන් නිර්මාණය කරනු ලැබුයේ පරගැති ආර්ථික සංස්කෘතික, අධ්‍යාපනික වට පිටාවත් ජඩ වාණිජ මාධ්‍ය ජාලයත් විසිනි. මේ අන්කිසිවක් නොව, අසූව දශකයේ උපන්, දේශයේ දූ පුතුන් මන්දබුද්ධිකයන් කරනු ලැබූ දේශද්‍රෝහි බලවේගයයි. සුපිරි තරු ද මහළු වී සම රැළි වැටෙන තුරු දරිදිය අදිනු ඇත්තේ මේ බලවේග වලටම මිස අන් කිසිවකට නොවේ.

තවත් ලෙසකින් කිවහොත් අසූවේ දරුවන් විසින් SMS ගසා බිහි කරන ලද සමාජය යළි ඔවුන්ටම වල කපනු ඇත. නමුත් ජාතියේ අවාසනාවට මේ මන්දබුද්ධිකයෝ ඒ බවක් නොදනිති.

**ඉඳුනිල් ප්‍රසන්න**
**ලංකා විදුලි බල මණ්ඩලය**